# *පරිපාලන යාන්ත්‍රණය තුළ මහජනයාට ඇති වගකීම පිළිබඳව නූතන රාජ්‍ය සේවකයාගේ කාර්යයභාරය අධ්‍යයනය කිරීම : (මොනරාගල දිස්ත්‍රික්කයේ, සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 126/A විලඔය ග්‍රාම නිලධාරී වසම ඇසුරින් )*

*ආර්.එම්.ටී. දුලංජලී* [1]

**සංක්ෂේපය**

නූතන ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන්හි ප්‍රධානතම කාර්ය කොටස රාජ්‍ය අංශය මැදිහත් වී ඉටු කරනු ලැබේ. මෙලෙස රාජ්‍ය අංශය මැදිහත්ව ඉටු කරනු ලබන කාර්යය කොටස මහජනයා මූලික කරගත් මහජනයාට වගකියන එකක් වේ. මෙම කාර්යයභාරය තුළ ප්‍රධාන ගාමක බලවේගය වනුයේ රාජ්‍ය සේවකයා වේ. එම නිසා නූතන පරිපාලන යාන්ත්‍රණය තුළ රාජ්‍ය සේවකයා කෙතරම් දුරකට මහජනයාට වගකියන කාර්යයභාරයක් ඉටු කරයි ද යන්න මෙහි දී පරීක්ෂා කෙරේ.

ඒ අනුව මෙහි අරමුණු වනුයේ වත්මන් රාජ්‍ය සේවකයින් විසින් මහජනයාට ඉටු කරන කාර්යයභාරය හා වගකීමේ ස්වභාවය හඳුනා ගැනීමත්, ග්‍රාමීය මට්ටමේ රාජ්‍ය සේවකයා හා ජනතාව අතර පවතින අන්තර් සබඳකමේ ස්වභාවය හඳුනා ගැනීමත්, ශ්‍රී ලංකාවේ පරිපාලන ව්‍යුහය තුළ රාජ්‍ය සේවකයන් හා ජනතාව අතර සමීප සබඳතා ගොඩනැගීමේ දී මුහුණපාන අභියෝග හඳුනා ගැනීමත් විය. මේ සඳහා යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය වන්නේ මොනරාගල දිස්ත්‍රික්කයේ සියඹලාණ්ඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 126/A විලඔය වසම පදනම් කර ස්ථර සසම්භාවී ක්‍රමය භාවිතා කොට ලබා ගත් නියදියෙන් ප්‍රාථමික දත්ත ලබාගෙන, එමෙන් ම ද්වීතික දත්ත ද උපයෝගී කොට ගනිමින් SPSS නම්, පරිගණක මෘදුකාංගය භාවිතා කරමින් දත්ත විශ්ලේෂණය කොට නිගමනවලට එළඹීමේ ක්‍රමවේදයයි.

මෙහි දී හඳුනා ගත හැකි වූයේ නූතන පරිපාලන යාන්ත්‍රණය තුළ මහජනයාට ඇති වගකීම ප්‍රවර්ධනය උදෙසා රාජ්‍ය සේවකයාට විශාල කාර්යයභාරයන් ප්‍රමාණයක් පැවරී ඇති බවයි. නූතන රාජ්‍ය සේවාව හරහා සංවර්ධන ක්‍රියාවලියට ලැබෙන දායකත්වය දුර්වලව ඇති බවත්, නූතනය වන විට රාජ්‍ය සේවකයින් හා ජනතාව අතර සබඳකම දුරස්ව ගොස් ඇති බවත් පැහැදිලි විය. පරිපාලන ක්‍රියාවලිය දේශපාලනීකරණයට ලක් ව තිබීමත්, රාජ්‍ය සේවකයා තම තනතුර හරහා ප්‍රභූත්වයක් අත්කර ගැනීමට උත්සාහ දැරීමත් තවත් මෙම තත්ත්වයට හේතු වූ බව පෙනී ගියේය. මෙවැනි පසුබිමක් තුළ රාජ්‍ය සේවකයාගේ කාර්යයභාරය මහජනයාට වගකියන තත්ත්වයට පත්කරලීම උදෙසා රාජ්‍ය සේවාවට පරිපාලන ක්‍රියාවලිය තුළ වැඩි වැදගත්කමක් ලබා දීමත්, දේශපාලන මැදිහත්වීම අවම කරමින් විධිමත් සැලසුම්කරණයකින් යුතු රාජ්‍ය සේවාවක් බිහිකරලීමත්, ජනතාව හා රාජ්‍ය සේවකයින් තමන්ගෙන් ඉටු විය යුතු වගකීම හරිහැටි හඳුනා ගැනීමත්, රාජ්‍ය සේවකයින් හට තමන්ගේ සේවයට සරිලන වේතනයක් ලබා දීමත්, සෑම සංවර්ධන ක්‍රියාවලියකම මූලික සාධකය ජනතාව බවට පත්කර ගැනීමට ක්‍රියාකිරීමත් වැදගත් බව පෙනී යයි.

**ප්‍රමුඛ පද :නූතන පරිපාලන යාන්ත්‍රණය, රාජ්‍ය සේවකයා**

1 ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය